# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2016 අගෝස්තු මස 19 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2016.08.19 දින නිකුත් කරන ලදී)**


## ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

ගරු මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එකී වගන්තියේ නීතිය බලපෑම වනුයේ—

(අ) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බදු ගෙවීමට යටත් වූ සහ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ සෙස් බදු ගෙවීමට යටත් වූ ඇතැම් භාණ්ඩ සඳහා ප්‍රදානය කොට ඇති බදු නිදහස, එකී බදු ගෙවනු ලබන්නේ මේ පනත යටතේ වූ ජාතිය ගොඩනැගීමේ බද්ද සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වූ එකතු කළ අගය මත බද්ද වෙනුවෙන් වන අවස්ථාවක දී එවැනි අවස්ථාවකට යටත්වන භාණ්ඩ සඳහා සීමා කිරීම වේ; සහ

(ආ) ඇතැම් කාණ්ඩවලට අයත් පුද්ගලයන් සම්බන්ධයෙන් එකී වගන්තිය යටතේ බදු ගෙවීමට යටත් පිරිවැටුමේ සීමා වෙනස් කිරීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එකී වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු නොලැබිය යුතු ඇතැම් තැනැත්තන් නිශ්චිතව සඳහන් කිරීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එකී වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ඇතැම් භාණ්ඩ සම්බන්ධයෙන් දැනට පවත්නා, බද්දෙන් නිදහස් කිරීමේ නිර්නායක, ප්‍රතිශෝධනය කිරීම වේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් "වලංගු කිරීමේ" වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර, එකී වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මේ පනතේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලබන බදු මුදල ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන සහ 5 වන වගන්තිවල විධිවිධාන යටතේ පිළිවෙළින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සහ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ පනතේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තන්ගෙන් මේ වගන්තියේ සඳහන් කාලසීමාව තුළ එකතු කිරීම වලංගු කිරීම වන අතර, එකී අදාළ කාලසීමාව ඇතුළත එසේ එකතු කරන ලද බද්දක් සම්බන්ධයෙන් යම් අධිකරණයකින් දෙන ලද තීරණයකට හෝ ආඥාවකට හෝ යම් අධිකරණයක් හමුවේ අවසන් නොවී පවත්නා යම් නීති කෘත්‍යයකට හෝ එකී විධිවිධානවලින් බලපෑමක් නොවිය යුතු බවට විධිවිධාන සැලසීම ද වේ.

**ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)**

එල්.ඩී.—ඕ. 28/2016.

## 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2016 අංක  දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, වෙන් වශයෙන් වූ ක්‍රියාත්මක වීමේ දිනයක් මෙය යටතේ නිශ්චිතව සඳහන් කර ඇත්නම් මිස, මෙම පනත 2016 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**2.** 2015 අංක 12 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:- 2009 අංක 9 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (iv) වන ඡේදයේ -

(අ) එහි (II) වන අනුඡේදයේ, ''ශීර්ෂ අංක යටතේ හඳුනා ගනු ලැබුවා වූ ද'' යන වචන වෙනුවට, ''ශීර්ෂ අංක යටතේ හඳුනා ගනු ලැබුවා වූ ද, මේ පනත යටතේ වූ ජාතිය ගොඩනැගීමේ බද්ද සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වූ එකතු කළ අගය මත බද්ද වෙනුවට'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එහි (12) වන අනුඡේදයේ, ''ආනයනය කිරීමේ දී'' යන වචන වෙනුවට, ''ආනයනය කිරීමේ දී මේ පනත යටතේ වූ ජාතිය ගොඩනැගීමේ බද්ද සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වූ එකතු කළ අගය මත බද්ද වෙනුවට'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ඇ) එහි (13) වන අනුඡේදයේ, ''ආනයනය කිරීමේ දී'' යන වචන වෙනුවට, ''ආනයනය කිරීමේ දී මේ පනත යටතේ

2—PL 010077—425 (2016/07)

වූ ජාතිය ගොඩනැඟීමේ බද්ද සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වූ එකතු කළ අගය මත බද්ද වෙනුවට'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (iii) වන ඡේදයේ -

(i) එහි (ආ) අනුඡේදයේ, ''නොඉක්මවන්නේ නම්; සහ'' යන වචන වෙනුවට, ''නොඉක්මවන්නේ නම්;'' යන වචන ආදේශ කිරීමෙන්;

(ii) එහි (ඇ) අනු ඡේදයේ ''එදිනට පසුව ආරම්භ වන කාර්තුවක් වන විට රුපියල් තිස්හත් ලක්ෂ පනස් දහසක් නොඉක්මවන්නේ නම්.'' යන වචන වෙනුවට, ''එදිනට පසුව, එහෙත් 2016 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන කාර්තුවක් වන විට රුපියල් තිස්හත් ලක්ෂ පනස් දහසක් නොඉක්මවන්නේ නම්; සහ'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(iii) එහි (ඇ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඈ) අදාළ කාර්තුව 2016 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් කාර්තුවක් වන විට, රුපියල් මිලියන තුනක් නොඉක්මවන්නේ නම්:

එසේ වුව ද, 2016 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා තම බද්දට යටත් පිරිවැටුම රුපියල් මිලියන තුනක් ඉක්මවන සහ රුපියල් තිස්හත් ලක්ෂ පනස් දහසක් නොඉක්මවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තාගෙන් 2016 මැයි මස 2 වන දින හෝ එදිනට පසුව උපචිත වන බද්දට යටත් පිරිවැටුම මත පමණක් බද්ද අය කරනු ලැබිය යුතු ය;"; සහ

(ආ) ඒ උපවගන්තියේ (iv) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(iv) එම කාර්තුව-

(අ) 2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2016 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන කාර්තුවක් වන්නේ නම් සහ ඒ තැනැත්තාට-

(අ) හෝටලයක්, ආගන්තුක නිවාසයක්, භෝජනාගාරයක් හෝ ඒ හා සමාන ව්‍යාපාරයක් පවත්වාගෙන යාමෙන්;

(ආ) දේශීයව සපයාගත් කෘෂි නිෂ්පාදන අලෙවියට සූදානම් කිරීම පිණිස සකස් කිරීමේ ක්‍රියාකාරකමකින්;

(ඇ) අධ්‍යාපන සේවා සැපයීම සඳහා දේශීයව ස්ථාපනය කරනු ලැබූ යම් අධ්‍යාපන ආයතනයක් විසින් අධ්‍යාපන සේවා සැපයීමෙන්; හෝ

(ඈ) ශ්‍රමය (මිනිස් බල) සැපයීමෙන්,

උපචිත වන බද්දට යටත් පිරිවැටුම රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන්නේ නම්:

එසේ වුව ද, 2016 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා (අ), (ඇ) හෝ (ඈ) අනුඡේදවල සඳහන් යම් ව්‍යාපාරයකින්, තම බද්දට යටත් පිරිවැටුම රුපියල් මිලියන තුනක් ඉක්මවන සහ රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තාට 2016 මැයි මස 2 වන දින හෝ එදිනට පසුව උපචිත වන බද්දට යටත් පිරිවැටුම මත පමණක් බදු අයකරනු ලැබිය යුතු ය;

(ආ) 2016 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන කාර්තුවක් වන්නේ නම් සහ, දේශීයව සපයාගත් කෘෂි නිෂ්පාදන අලෙවියට සූදානම් කිරීම පිණිස සකස් කිරීමේ ක්‍රියාකාරකමකින් ඒ තැනැත්තාට උපචිත වන බද්දට යටත් පිරිවැටුම රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන්නේ නම්;”.

**3.** 2009 අංක 32 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(ඉ) (i) තක්සේරු වර්ෂයේ අදාළ කාර්තුව සඳහා මේ වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් දිනයේ දී හෝ එදිනට පෙර වාර්තාවක් ඉදිරිපත් කොට ඇති යම් තැනැත්තකු, ඒ ආදායම් බදු වාර්තාව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 106 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (7) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කොට ඇත්නම්, අදාළ කාර්තුව යෙදෙන තක්සේරු වර්ෂයට ඉක්බිතිවම වූ තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස තිස්වන දින සිට මාස දහඅටක් ඉකුත් වූ පසුව ඒ තැනැත්තා සම්බන්ධයෙන්; හෝ

(ii) මේ වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් දිනයේ දී හෝ එදිනට පෙර වාර්තාවක් ඉදිරිපත් කිරීම පැහැර හැර ඇති යම් තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ කාර්තුව යෙදෙන තක්සේරු වර්ෂයට ඉක්බිතිවම වූ තක්සේරු වර්ෂයේ නොවැම්බර් මස තිස්වන දින සිට අවුරුදු හතරක් ඉකුත් වූ පසුව,

මේ පනත යටතේ තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය”.

**4.** 2015 අංක 12 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයේ I වන කොටසෙහි -

(අ) එහි (xi) අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(xi) 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව වූ යම් කාලපරිච්ඡේදයක් සඳහා, රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද ඛණිජ තෙල් හා ඛණිජ තෙල් නිෂ්පාදන;";

(ආ) එහි (xvi) අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(xvi) යම් නිවාස ව්‍යාපෘතියක් හැර, රටට අත්වන ආර්ථික ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින්, අමාත්‍යවරයා විසින් 2016 මැයි මස 2 වන දිනට පෙර අනුමත කරන ලද පරිදි වූ යම් නිශ්චිත ව සඳහන් ව්‍යාපෘතියක් සඳහා රජයට ලැබෙන විදේශ අරමුදල් හෝ පරිත්‍යාගවලින් ආනයනය කරනු ලබන හෝ සපයනු ලබන භාණ්ඩ;";

(ඇ) එහි (XLIII) අයිතමයේ "ආනයනය කිරීමේ දී" යන වචන වෙනුවට "ආයනයනය කිරීමේ දී මේ පනත යටතේ වූ ජාතිය ගොඩනැගීමේ බද්ද සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වූ එකතු කළ අගය මත බද්ද වෙනුවට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඈ) එහි (XLIX) අයිතමයේ "සිගරට් නිෂ්පාදනය මත" යන වචන වෙනුවට " සිගරට් නිෂ්පාදනය මත, මේ පනත යටතේ වූ ජාතිය ගොඩනැගීමේ බද්ද සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වූ එකතු කළ අගය මත බද්ද වෙනුවට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ඉ) එහි (L) අයිතමයේ "ආනයනය කිරීමේ දී" යන වචන වෙනුවට, "ආනයනය කිරීමේ දී මේ පනත යටතේ වූ

ජාතිය ගොඩනැගීමේ බද්ද සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වූ එකතු කළ අගය මත බද්ද වෙනුවට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ II වන කොටසෙහි -

(අ) එහි (ii) වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(ii) 2016 මැයි මස 2 වන දිනයට පෙර අවසන් වූ යම් කාල පරිච්ඡේදයක් සඳහා විදුලිබලය සැපයීම;"; සහ

(ආ) එහි (xxviii) වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(xxviii) 2016 මැයි මස 2 වන දිනයට පෙර අවසන් වූ යම් කාලපරිච්ඡේදයක් සඳහා, 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ බදු ගෙවීමට යටත් වන විදුලි සංදේශ සේවා සහ එම පනතෙහි විදුලි සංදේශ සේවා අර්ථකථනය කිරීමේ දී එම බදු ගෙවීමෙන් විශේෂයෙන් බැහැර කරන ලද සේවා;".

**5.** 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී, මෙම පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී මේ පනතේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලැබූ බදු මුදල ප්‍රධාන ප්‍රඥප්තියේ පිළිවෙලින් 4 වන හෝ 5 වන වගන්තිවල විධිවිධාන යටතේ අවස්ථාවෝචිත පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ විසින් මේ පනතේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තකුගෙන් එකතු කරනු ලබන අවස්ථාවක දී එම එකතු කිරීම සියලු කාර්ය සඳහා වලංගු ලෙස කරන ලද බවට සලකනු ලැබිය යුතු ය: වලංගු වීම.

එසේ වුව ද, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන ඉහත කී කාලසීමාව තුළ එකතු කරන ලද යම් බද්දක් සම්බන්ධයෙන්

අධිකරණයකින් දෙන ලද තීරණයකට හෝ යම් ආඥාවකට හෝ අධිකරණයක අවසන් නොවී පවතින නීති කෘත්‍යයකට හෝ බලපානු නොලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.